# මුදල් නෝට්ටු තුළින් ඉස්මතුවන ජාතික උරුමයන් පිළිබඳ විමර්ශනයක්

කේ.කේ.එස්. කරවනැල්ල[1], ඩී.සී.යු. සිල්වා[2]

ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් තේමාවන් 11කින් මුදල් නෝට්ටු මුද්‍රණය කර තිබේ. 1981 වර්ෂයේදී ජාතික උරුමයන් හා පුරාවිද්‍යාත්මක තේමාව යොදා ගනිමින් 8 වැනි මුදල් නෝට්ටු කාණ්ඩය ලෙස රුපියල් 10, 20, 50, 100, 1000, 2000 යන මුදල් නෝට්ටු නිකුත් කර ඇත. මෙම තේමාව තුළින් වඩාත් ප්‍රමුඛතාවය ලැබී ඇත්තේ කුමන අගය සහිත උරුමයන් සඳහා ද යන්න සහ ඒ සඳහා බලපෑ සමාජීය, ආර්ථික, දේශපාලන තත්ත්වයන් පිළිබඳ විමර්ශනයක් මෙමඟින් සිදු කෙරේ. මේ සඳහා පුස්තකාල පරිශීලනය සහ මුද්‍රණය කරන ලද නෝට්ටු අධ්‍යයනය කිරීම මූලික කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. මුදල් නෝට්ටු අධ්‍යයනය කිරීමේදී එහි නිරූපණය කර තිබෙන උරුමයන්, සංස්කෘතික උරුමය හා ස්වාභාවික උරුමය ලෙස හඳුන්වාදීමට පුළුවන. සංස්කෘතික උරුමය ස්පර්ශිත හා අස්පර්ශිත උරුමය යටතේ වෙන්වන අතර, ස්පර්ශිත උරුමය නිශ්චල හා චංචල උරුමය ලෙසත් වර්ග කළ හැකිය. නිශ්චල උරුමය යටතේ, ගොඩනැගිලි ප්‍රධාන තේමාව ලෙස ගැනීමේ දී කැලණි විහාරය, රුවන්වැලිසෑය, පත්තිරිප්පුව සහ ජේතවනාරාමය යන ආගමික ගොඩනැගිලි නිරූපණයට ප්‍රමුඛත්වයක් දී තිබේ. සීගිරිය යොදා තිබීම තුළින් ඓතිහාසිකමය වශයෙන් සංස්කෘතිමය උරුමයට විශේෂිත ස්ථානයක් ලබා දී තිබේ. මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ල මුදල් නෝට්ටුව තුළින් රටක ආර්ථිකයේ තීරණාත්මක බව ඉන් නිරූපණය කර ඇති බව උපකල්පනය කළ හැකිය. යාපහුව හා නිදහස් චතුරස්‍රයේ තිබෙන සිංහ මූර්තිය තුළින් සිංහලයාගේ අනන්‍යතාවය මූර්තිමත් කිරීමට උත්සහ දරා ඇත. චංචල උරුමයන් යටතේ මුරගල, මංජුසාව, සඳකඩපහණ වැනි නිර්මාණ මුද්‍රණය කර තිබේ. අස්පර්ශිත උරුමයන් යටතේ, රිටිපන්න ධීවරයින්, තේ දළු කඩන කාන්තාවන්,උඩරට පහතරට නැටුම් සම්ප්‍රදායන් හා සීගිරි බිතුසිතුවම් යොදාගෙන තිබේ. ඒ තුළින් ලාංකේය ජනතාවගේ සමාජ ආර්ථික පසුබිම, ඔවුන් සතු කලා හැකියාවන් හා ලංකාවේ ප්‍රචලිතව ඇති කලා අංග කෙරෙහි අවධානය යොමුකර ඇත. ස්වාභාවික උරුම සණයට අයත්වන බෝවතැන්න ජලාශ වේල්ලත්, හික්කඩුව මුහුදු පත්ලේ කොරල්පරත් යොදාගෙන තිබීම අනුව ලෝක උරුමයන් සඳහා මෙම කාල වකවානුව තුළ ලෝකයේ ඇති වූ ප්‍රබෝධය සහ ඒ අතරින් සංස්කෘතික උරුමයට දුන් ප්‍රමුඛතාවය නෝට්ටු මුද්‍රණයට බලපා ඇත. තව ද 1978න් පසුව ඇති වූ විවෘත්ත ආර්ථික රටාව ද මෙයට බලපා ඇති බව නිගමනය කළ හැකිය. එමෙන්ම 1980 දශකය වනවිට මෙරට පුරාවිද්‍යාත්මක හා ස්වාභාවික උරුමය කෙරෙහි ජනතා අවධානය හා ආකර්ශනය යොමු වී තිබුණි. ඒ හේතුවෙන් ලංකාව සතු සුවිශේෂි වූ විවිධත්වයෙන් යුතු උරුමයන් ජනතාව තුළ ප්‍රචලිත කිරිමේ අරමුණින් හා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරිමට ගත් උත්සහයක් ලෙස නෝට්ටුවලට මෙවැනි තේමා යොදා ගැනීමට උත්සුක වී තිබේ.

ප්‍රමුඛ පද : මුදල් නෝට්ටු, ජාතික උරුමයන්, විමර්ශනය, ස්වාභාවික උරුමය

[1 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sewwandikarawanell@gmail.com